# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## முதியோர்களுக்கான தேசிய செயலகம்

## National Secretariat for Elders

www.srilankaeldercare.gov.lk

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# හා
# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

- 2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමත් ඔවුන් හට ආත්ම ගෞරවයෙන් ස්වාධීනව ජීවත්විමට අවස්ථාව සලසා දීමත් ආයතනයේ කාර්ය භාර්ය වේ.

# දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුළින් ක්‍රියාකාරි,
ජවසම්පන්න හා ඵලදායි වැඩිහිටි දිවියක් උදා කිරීම.

# මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය,
සහභාගිත්වය හා අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන
කාර්යන්හි
වැඩිහිටියන්ගේ සහභාගිත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැක දීමත්
අපගේ මෙහෙවර වේ.

# අරමුණු

- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවධර්නය කිරීම.
- වැඩිහිටියන් මුහුණ දෙන ප්‍රශ්න හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම.
- වැඩිහිටි දැනුම, කුසලතා, අත්දැකීම් භාවිතා කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සමාජ සංවධර්නයක් ඇති කිරීම.
- සෞඛ්‍ය සම්පන්න වැඩිහිටිවියක් වෙනුවෙන් දැනුවත් කිරීම් පැවැත්වීම.
- අඩු ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙනුවෙන් මාගෙර්ාපදේශනය සහ සුභසාධනය ලබා දීම.

# අරමුදල් ප්‍රභවයන්

- භාණ්ඩාගාර ප්‍රතිපාදන
- වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල

# වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සිදුකරනු ලබන සේවාවන්

## 1. “ආරෝග්‍ය” වැඩිහිටි රෝගාධාර වැඩසටහන.

බෝ නොවන රෝගවලින් පීඩා විඳින අඩු ආදායම්ලාභී අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් 2,000ක් සඳහා රු. 25,000 බැගින් මූල්‍යාධාර ලබාදීම. (*පිළිකා රෝගය, වකුගඩු ආශ්‍රිත රෝග, හෘද රෝග, ස්නායු රෝග, පෙනහළු ආශ්‍රිත රෝග, අක්මාව අන්ත්‍රය ආශ්‍රිත රෝග, පූර්ණ අන්ධභාවය, පේෂි හා හන්දි රෝග හා අංශභාගය යන රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන*)

## 2. ශ්‍රවණ උපකරණ, අක්ෂ කාච හා ඇස් කණ්නාඩි ලබාදීම.

අඩු ආදායම්ලාභී වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් සඳහා ශ්‍රවණ උපකරණ 2000ක්, අක්ෂිකාච 2000ක් හා ඇස්කණ්නාඩි 2000ක් ලබාදීම.

## 03. වැඩිහිටි සත්කාරක සේවා පුහුණු වැඩසටහන

සුරක්ෂිත වැඩිහිටි රැකවරණයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු සත්කාරක කණ්ඩායම් පුහුණු කිරීම
වැඩිහිටි නිවාසවල සේවය කරන පාලක පාලිකාවන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

## 04. කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීම

රුපියල් මිලියන 300 ක වියදමින් සියලු මූලික පහසුකම් වලින් යුක්තව වැඩිහිටියන් 140 දෙනෙකු සඳහා කතරගම ප්‍රදේශයේ වැඩිහිටි නිවාසයක් ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

## 05. වැඩිහිටි නිවාස වල පහසුකම් වැඩිදියුණු කිරීම.

දිවයින පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන් හී පවතින අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම මෙමගින් බලාපොරොත්තු වේ. රුපියල් මිලියන 02ක බැගින් එක් නිවාසයක් වෙත ආධාර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

## 06. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම

වැඩිහිටි ප්‍රජාවගේ විවේකි කාලය වඩාත් ඵලදායි ලෙස ගත කිරීම සඳහා වන දිවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3.5ක් බැගින් ආධාර ලබා දිම. මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලැබේ.

## 07. "දිරිය පියස" නිවාස යෝජනා ක්‍රමය

සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සමග ජිවත්වන ආබාධිත හෝ තනි මාපිය පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරිම සඳහා රු.500,000/-  බැගින් මුදල් ලබා දි  නිවාස ඒකක 50 ක් මෙම වසර තුළ ඉදි කිරීමට සැලසුම් කර ඇත.

## 08. ."සුවපහසු" මුලාධාර යෝජනා ක්‍රමය

අඩු ආදායම්ලාභි වැඩිහිටියන් සඳහා තම නිවාසයන් හි ජිවත්වීමේදී අවශ්‍ය කරනු ලබන අවම පහසුකම් හා සනිපාරක්ෂ පහසුකම් සලසා ගැනීම සඳහා එක් අයෙකුට රු.100,000/- ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභීන් 1,500 දෙනෙකුට ආධාර ලබා දීම සිදු කරනු ලැබේ

## 09.වැඩිහිටි චාරිකා සංවිධානය

වැඩිහිටි ප්‍රජාවගේ ආධ්‍යාත්මික හා ස්වයං පරිපූර්ණත්වය සහතික කිරීම සඳහා ක්‍රියාකාරි වැඩිහිටි සංවිධාන වෙනුවෙන්, ඔවුන් විසින් සංවිධානය කරනු ලබන වැඩිහිටි චාරිකා යාමට රු.75,000 ක උපරිමයකට යටත්ව අවශ්‍ය වියදම් වෙනුවෙන් චාරිකා 375 ක් සඳහා ආධාර මුදල් ලබා දීම මේ යටතේ සිදු කරනු ලැබේ.

## 10. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්විම් සඳහා ආධාර ලබා දීම

මේ යටතේ දිවයින පුරා පිහිටුවා ඇති වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා භෞතික උපකරණ ලබා ගැනීමට එක් සමිතියකට රු.100,000/- ක උපරිමයකට යටත්ව ආධාර ලබා දීම සිදු කරනු ලැබේ.

## 11. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සදහා උපකරණ ලබා දීම

ඉදිකරනු ලබන හා දැනට පවතින දිවා මධ්‍යස්ථානයන් හි වෙසෙන වැඩිහිටියන්ගේ එදිනෙදා ක්‍රියාකරකම් සදහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම වෙනුවෙන් උපරිම රුපියල් ලක්ෂ 5කට යටත්ව දිවා මධ්‍යස්ථාන 25 ක් වෙත උපකරණ ලබා දීම සිදු කෙරේ.

## 12. ස්වයං රැකියා ආධාර ලබාදීම

වයස අවුරුදු 60 සම්පූර්ණ වූ, අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම හා රටේ ආර්ථිකයට සවියක් වීම සඳහා
රු. 50,000.00 ක උපරිමයකට යටත්ව වැඩිහිටියන් 670ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.

## 11. ඩිජිටල් සාක්ෂරතාවය හා යෝග අභිප්‍රේරණ ඊකියා උත්පාදන පුහුණු වැඩසටහන

එක් පළාතකට වැඩසටහන් 05ක් වන අයුරින් පළාත් 09 තුළ තෝරාගත් දිස්ත්‍රික්ක සඳහා වැඩසටහන් 45ක් පැවැත්වීම.

## රැකියා පාදක මූලාධාර

එක් වැඩසටහනකට රු.200,000 බැගින් දිවා මධ්‍යස්ථාන 20ක් තුළ රැකියා උත්පාදන වැඩසටහන් පැවැත්වීම.

## සරළ යෝග ව්‍යායාම සහ ව්‍යායාම වැඩමුළු පැවැත්වීම

පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් 03ක් පැවැත්වීම.

## 13. 14. වෛද්‍ය කඳවුරු පැවැත්වීම

එක් දිස්ත්‍රික්කයකට රු.900,000 බැගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08ක් තුල වැඩිහිටි ජංගම වෛද්‍ය කඳවුරු පැවැත්වීම.

## 15. වියපත්භාවය සම්බන්ධයෙන් තරුණ ප්‍රජාව දැනුවත් කිරීම.

එක් දිස්ත්‍රික්කයකට 01 බැගින් (එක් වැඩසටහනකට පුද්ගලයින් 50 දෙනෙකු)

## 17. විශ්‍රාම පූවර් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කායර්ාල 25 වැඩසටහන් 25ක්ද , ප්‍රධාන කායර්ාලයේ වැඩසටහන් 02ක්ද බැගින් වැඩසටහන් 27ක්ද පිවිත්වීම.

# ස්වයං රැකියා අධාර ලබා දීම















# ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත් නිකුත් කිරීම









# ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශ්‍රවණ උපකරණ ලබා දීම





# ප්‍රමිතිගතව වැඩිහිටි නිවාස ඉදිකිරීම් හා අළුත් වැඩියාව





# පන්නල වෙල්කම් විලේජ් ,මාලිගාතැන්න හා කතරගම වැඩිහිටි නිවාසය නඩත්තුව හා පරිපාලනය






## "ආරෝග්‍යා" සෞඛ්‍ය වැඩසටහන -වැඩිහිටි නිවාස තුල ජීවත්වන වැඩිහිටියන්ගේ වෛද්‍ය පහසුකම් වෙනුවෙන් මුල්‍යාධාර සැපයීම






# වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ආධාර ලබාදීම










# දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය








වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## முதியோர்களுக்கான தேசிய செயலகம்

## National Secretariat for Elders

www.srilankaeldercare.gov.lk

Block D, 2nd Floor, Sethsiripaya ii, Battaramulla
**Phone:** 0112054164 **Email:** nsemss@gmail.com